# හොඳ හොඳ ළමයින් අපි වගේ

**ගීතය වාදනය කරන්න.** →

**එයට සවන්දෙමින් ගීතයේ පද කියවන්න**

හොඳ හොඳ ළමයින් අපි වගේ
මේ මව්බිම ඉපදී ඉන්නේ
අත්පොඩි ටික එක මුතු කරලා
රකිමු අපේ සිරි ලක් අම්මා //

හොරකම් මැරකම් නැති ව සිතේ
හිටියොත් හොඳ නම නිතර ලැබේ
වැරදි කළෝතින් පව් සිදු වේ
සමාව නම් කිසි දිනක නැතේ
පොඩි අය ම යි ලොකු අය වන්නේ
කෝපය හින්දයි පොඩි වන්නේ

හිත තුළ වෛරය නැති කරලා
ඉන්න ඕනේ හොඳ ළමයි වෙලා
අත් පොඩි ටික එකමුතු කරලා
රකිමු අපේ සිරි ලක් අම්මා //

LIVEWORKSHEETS

යමක් පවසන විට එය පවසන වාග් විලාසය (කියන ආකාරය) ඉතා වැදගත් වේ. පහත දැක්වෙන එක් එක් ප්‍රකාශ මත ක්ලික් කර ඒවා පවසන වාග් විලාසයට හොඳින් සවන් දෙන්න. ඒ අනුව ඒවායේ උච්චාරණ ස්වභාවය කුමක්දැයි තෝරන්න.

| | | |
|---|---|---|
| එන්න එපා | එන්න එපා | එන්න එපා |
| කොහෙ ද යන්නේ | කොහෙ ද යන්නේ | කොහෙ ද යන්නේ |
| ආ මෙන්න | ආ මෙන්න | ආ මෙන්න |
| කවුද ඔයා | කවුද ඔයා | කවුද ඔයා |
| ඇයි මොනව ද ඕන | ඇයි මොනව ද ඕන | ඇයි මොනව ද ඕන |
| කන්න මේක | කන්න මේක | කන්න මේක |
| මෙහෙට එන්න | මෙහෙට එන්න | මෙහෙට එන්න |

LIVEWORKSHEETS

යම් අයෙකු ඔබට කතා කරනවාට කැමති කුමන ආකාරයටද?

- තර්ජනාත්මක ස්වරූපයෙන්
- විධානයක ස්වරූපයෙන්
- කාරුණික ස්වරූපයෙන්

ගැටුමකට මුල්විය හැකි වන්නේ පහත ඒවායින් කුමක්ද ?

- තර්ජනාත්මක ප්‍රකාශයක්
- ඉල්ලා සිටීමක්
- කාරුණික අවවාදයක්


වම්පස ඇති ප්‍රකාශ වඩාත් හොඳින් කිවහැකි අකාර දකුණුපස ඒවායින් තෝරා යා කරන්න.

| | |
|---|---|
| යනවා එළියට | කරුණාකර නිහඬ වෙන්න |
| පාරෙන් අයින් වෙනවා | ඇවිත් වාඩිවෙන්න |
| මෙහෙට එනවා | සියළුදෙනා මේක අහගන්න |
| ඇවිත් වාඩිවෙනවා | කරුණාකර එළියට යන්න |
| සද්දේ නවත්වනවා | කරුණාකර පාර ඉඩ දෙන්න |
| හැමෝම මේක අහගන්නවා | මෙහාට එන්නකෝ |
| රිමෝර්ට් එක මට දෙනවා | රිමෝර්ට් එක මට දෙනවද |

**යමක් පවසන විට**

**පවසන දෙයටත් වඩා පවසන ආකාරයයි වැදගත්**


Quiz
මුහුණේ ඉරියව් නිවැරදිව නම් කරන්න.
START
පරිසරය - අපේ යහපැවැත්ම


True or false
හොඳ පුරුදු හා නරක පුරුදු තෝරන්න
START
පරිසරය - අපේ යහපැවැත්ම


Quiz
හොඳ සෞඛ්‍ය පුරුදු නම් කරන්න.
START
පරිසරය - අපේ යහපැවැත්ම